මගේ ලෝකය

ඇසෙන දැනෙන දේ.. හිතට වැදෙන දේ..



ජගත් පේ එදිරිසිංහ

Accept no one's definition of your life; define yourself.

Harvey Fierstein

අයියා ලොකු බ්‍රවින් පේපරයක් මේසය මත එළා ගෙන බර වැඩක ය. කතුරකින් යම් යම් දේ ලියූ කඩදාසි කෑලි කපමින් ඔහු ඒවා කොළය මත අලවයි. කතුරින් කපන විට ඔහුගේ කට ද ඒ අනුව යන සැටි මට පෙනෙයි.
අයියා සිටියේ අටවන පන්තියේ ය. ඒ වකවානුවේ ඔහු උගත්තේ මහරගම විද්‍යාකර විද්‍යාලයයේ ය.

උඩහමුල්ල රජයේ බෞද්ධ කණිෂ්ඨ විද්‍යාලයයේ ඉගෙන ගනිමින් සිටි අපේ අයියා විද්‍යාකරයට ගියේ පහේ ශිෂ්‍යත්වය සමත්වීම නිසා ය. (ශිෂ්‍යත්වය සමත් වන දරුවන් කොළඹ රාජකීය ආනන්ද නාලන්ද විද්‍යාල වලට දමන්නට වෙහෙසෙන දෙමාපියන් සිටින රටක අපේ තාත්තා අයියාව ඇතුල් කළේ මහරගම විද්‍යාකරයට ය. මේ ගැන තාත්තා බොහෝ දොස් අසන්නට ඇති බව නිසැක ය. සාමාන්‍ය පෙළ සමත් වීමෙන් පසුව අයියා නාලන්දාවට ඇතුල් කරන්නට තාත්තාට සිතුණේ එනිසා විය යුතු ය)

''මොනාද කරන්නෙ..?'' මම ඇසුවෙමි.
''පත්තරයක් හදනවා..'' අයියා කීවේ ය.
''පත්තරයක්..?''

''මේ බ්‍රවින් පේපර් එක පත්තරයක් වගේ තුනට නවනවා.. පන්තියේ ළමයි ලියන ලිපි මේකේ පිටු වල අලවනවා.. ඊට පස්සෙ පන්තියේ ළමයින්ට කියවන්න දෙනවා..''

''මොකක්ද පත්තරේ නම්..?''
''ළමා ලෝකය''

පත්තරයේ උඩින්ම අපූරු අකුරු වලින් ''ළමා ලෝකය'' යයි ලියා ඇත. ඊට පහළින් කරඬුවක් දරාගෙන පෙරහැරක යන අලියෙකුගේ සිතුවමකි. එය ඇඳ තිබුණෙ ජගත් නම් අයකි. සිතුවමට යටින් අයියා ලියූ කවි දෙපදයකි.

''කරඬුව රැගෙන පෙරමුණෙ යන මහා ඇතා
දුටු හැටි බලව 'අට ඩී' යෙහි මේ ජගතා''

ජීවිතයේ බොහෝ කාලයකට පසුව මා පත්තරකාරයකු කරනු ලැබුවේ අයියා ගේ මේ කුඩා පත්තරය විසින් බව ජීවිතය දෙස ආපසු හැරී බලන මේ මොහොතේ මට සිතෙයි. මගේ ජීවිතයේ බොහෝ දේ වෙනස් කරන්නට මේ කුඩා පත්තරය ඉවහල් වූ වා නොවේ දැයි සිහිපත් වන විට සිතට දැනෙන්නේ විමතියකි. දැන හෝ නොදැන අයියා මගේ ජීවිතයට කළ බලපෑම කොයි තරම් සුවිශාල ද?

අයියා ගේ පත්තරය මාස ගණනාවක් නොකඩවා පළ වී නැවතී ගියේ ය. එහෙත් ඒ කාලය තුළ ඒ පත්තරය මට විශාල අත්දැකීම් සමුදායක් ලබා දුන්නේ ය.

දැන් මගේ වාරය යි. එවකට මා ඉගෙන ගනිමින් සිටියේ උඩහමුල්ල රජයේ බෞද්ධ කණිෂ්ඨ විද්‍යාලයයේ හයේ පන්තියේ ය.

(ජීවිතයේ පසු භාගයක මාර්ග සංවර්ධන අධිකාරියේ යාන්ත්‍රික ඉංජිනේරුවකු ලෙස සේවය කරමින් සිටි කාලයේ මම මගේ ජීවිතයට සමීපව සිටි අයකු සමග මේ කුඩා විද්‍යාලයය අසළින් යමින් සිටියෙමි. මා උගත් සමයේ මෙන් නොව ඒ වන විට එය විශාල භූමියක පැතිරුණ විද්‍යාලයයක් වී තිබුණි.

''මේ තමයි මම ඉස්සෙල්ලාම ගිය ඉස්කෝලෙ..'' මම ඇයට කීවෙමි.
''කාටවත් ඇහෙන්න කියන්න එපා.. ලැජ්ජාවෙ බැහැ..''

''ඇයි..? තමන් ජීවිතේ පටන් ගත්තෙ මේ වගේ පොඩි ඉස්කෝලයකින් ය කියලා කියන්න ලැජ්ජා වෙන්නෙ මොකටද?''

''ඔයාගෙ දර්ශණෝ ප්‍රායෝගික ජීවිතේට ගැළපෙන්නෙ නැහැ.. හැමෝම බලන්නෙ තමන් රෝයල් ආනන්ද නාලන්ද වගේ ඉස්කෝල වල ඉගෙන ගත්තා කියලා පෙන්නන්න.. තමන් මේ වගේ පොඩි ඉස්කෝලක ඉගෙන ගත්තා කියලා කියන කෙනෙක් පුලුවන් නම් මට පෙන්නන්න..'' ඈ කිවා ය.

මම නිහඬ වීමි.)

''අපි පත්තරයක් පටන් ගමු ද?''මම පන්තියේ මගේ ළඟින්ම සිටි සගයා වූ සිරිනිමල් (සිරිනිමල් අමරතුංග) ගෙන් ඇසුවෙමි. (සිරිනිමල් අමරතුංග ජීවිතයේ බොහෝ කාලයක් මගේ ළඟින්ම සිටි මිතුරකු විය. සිය හිරිමල් යොවුන් වියේ දී කරමින් සිටි බාහිර උපාධියත් පෙම්වතියත් රැකියාවත් අතහැර දමා ජනතා විමුක්ති පෙරමුණේ පූර්ණකාලීනයකු බවට පත් වූ ඔහු එම ව්‍යාපාරයේ අධ්‍යාපන අංශයේ ක්‍රියාකාරිකයකුව සිට අසූව දශකය අග හීෂණ සමයේදී අතුරුදන් විය. ඔහු පිළිබඳ මතකය වෙනම දවසක අවදි කළ යුතු යයි මට සිතෙයි)

''කොහොමද කරන්නෙ..'' ඔහු අසයි.

අයියාගේ පත්තරය බලා සිට ලත් අත්දැකීම හොඳටම සෑහේ. මම මේ අතින් ලියන පත්තරය ගැන සිරිනිමල්ට විස්තර කළෙමි. ඔහු එකඟ විය. මම සංස්කාරකවරයා වූයෙමි. ඒ කාලයේ අපි කීවේ ''කර්තෘ'' කියා ය. සිරිනිමල් උපකර්තෘ වරයා විය. අයියාගේ පත්තරය නැවතී තිබුණ හෙයින් මගේ පත්තරය ද ''ළමා ලෝකය'' නමින්ම පටන් ගත්තෙමි.

අපේ පත්තරය පොතක් සේ සකස් කළ එකක් විය. අපේ මේ උත්සාහය දුටු සේනාධීර නම් ගුරු මහතකු රෝනියෝ කොළ මිටියක් අපට දුන්නේ ''මේකෙන් පත්තරේ හදන්න'' යි කියමිනි.

මේ කුඩා පත්තරයට මම නවකතා ලිව්වෙමි. චිත්‍රකතා ඇන්දෙමි. කවි ලිව්වෙමි. එය මට අපූරු අභ්‍යාසයක් විය.

අතින් ලියා සකස් කළ මේ කුඩා පුවත් පත පසු කළෙක මා අතින් බිහි වූ ''විද්‍යාව'' (විද්‍යා අධ්‍යාපනික පුවත් පත - ශ්‍රී ලංකාවේ දී) පහන (ඕස්ට්‍රේලියාවේ දී) සන්නස (ඕස්ට්‍රේලියාවේ දී) පුවත් පත් සඳහා අඩිතාලමක් වූවා නොවේදැයි දැන් මට සිතෙයි.

හතේ පන්තිය අවසානයේ අපේ අම්මා මා කෝට්ටේ ශාන්ත තෝමස් විද්‍යාලයයට ඇතුල් කළා ය. මගේ පත්තරය ද එයින් නැවතුණි.

එහෙත් හයේ පන්තියේදී සෑදුණ පත්තර පිස්සුවෙන් අදත් මම බොහෝ දුක් විඳිමින් සිටින්නෙමි.

මසුරන්



ජීවිතයයේ සාර්ථකත්වය මනින්න සමහරුන් පෙළඹී සිටින්නේ ගේ දොර යාන වාහන තියන එකෙනුයි. එවැනි සම්පත් තිබූ පමණින් ඔහු හෝ ඇය සමාජයේ සාර්ථක පුරවැසියකු වන්නේ නැහැ.

සංකීර්ණ වූ සමාජයේ කලාව කියන්නේ ඉතා සියුම් ලෙස චින්තනය කළ යුතු සංකීර්ණ විෂයයක් එයින් සාර්ථක ජීවිතයකට අවශ්‍ය රසඥතාව සමඟ ප්‍රඥාව අපට ලබා ගත හැකියි.

ප්‍රවීණ කලාකරු ජයලත් මනෝරත්න
ජාඇල ප්‍රාදේශීය සභාවේ 2007 සාහිත්‍ය උත්සවයේ දී

spot on
MOBILE MECHANIC
SERVICE CENTRE

RWC
Tune-up/Service
Starter Motors/Alternators
Batteries
Major & Minor Repairs
Pre-Purchase Vehicle Inspection
Brakes/Clutches
Auto Trans/Power Steering
CV Joints/Drive Shafts
Breakdown Service
All Makes & Models



ඔබේ වාහනයේ
සියලු අලුත්වැඩියාවන් සඳහා
විශ්වාසවන්ත සේවාව

WE PROVIDE
FULL MECHANICAL &
BREAKDOWN SERVICES

PROFESSIONAL
FAST EFFICIENT &
AFFORDABLE SERVICE

Ubaya Dewapriya (Dew)

14/50 Camp Road Broadmeadows Vic 3047
Ph: 9359 4848 Mobile: 0421 285 181